**ශීර්ෂය 334 - බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 334 බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට  බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ  වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2023 දෙසැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත්කර තිබූ මූල්‍ය ප්‍රකාශනයෙහි වර්ෂය තුළ මු.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශණයෙහි (ඇමුණුම ii) පාඩු හා හානි සිද්ධි 02 කට අදාළව රු. 137,000ක වටිනාකමක් පොතෙන් කපා හැර ඇති නමුත්, උක්ත සිද්ධින් 02 හි අලාභයේ ස්වාභාවය කුමක් ද යන්න මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ඇමුණුම (ii) හි දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 109 යටතේ වන පොතෙන් කපා හැරීම් පිළිබඳ ප්‍රකාශනයන්හි (ඇමුණුම ii) අලාභයේ ස්වභාවය කුමක් ද යන්න සඳහන්ව නොමැති අතර, එම වත්කම් අස්ථානගතවීමෙන් සිදු වූ අලාභය ලෙස නිවැරදි විය යුතු බව දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

**(අ). ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛනය පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **බැරකම් පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් | මුදල් රෙගුලාසි |

| | | |
|---|---|---|
| පවත්වා නොතිබුණි. | ලේඛනයක සටහන්කර පවත්වාගෙන ගොස් නොමැති අතර, එය පරිගණක විසිරුම් පතක (Excel Spread Sheet) පවත්වාගෙන ගොස් ඇති බව දක්වා තිබුණි. | 214 ප්‍රකාරව බැරකම් ලේඛනය පරීක්ෂා කළ හැකි වන පරිදි පවත්වා ගත යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 04 ක් සඳහා මුදල් රෙගුලාසි 66/69 යටතේ රු.64,160,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණ ද, වර්ෂය අවසානයේ එලෙස මාරු කරගන්නා ලද වැය විෂයයන් 04 හි ඉතුරුම් සියයට 23 සිට සියයට 49 ක පරාසයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 66/69 යටතේ වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා ස්ථිර පත්වීම් ලබා නොදීම නිසා පුහුණු දීමනා පමණක් ගෙවීමට සිදු වීම,<br>දෙපාර්තමේන්තුව 2023/12/31 දිනට විසුරුවා හැරීමට තීරණය කිරීම නිසා අපේක්ෂිත වියදම් දැරීමට සිදු නොවීම සහ සංවර්ධන නිලධාරීන් සැලකිය යුතු පිරිසක් 2023 වර්ෂයේ දෙසැම්බර් මාසය තුළදී වෙනත් දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරුවීමත් නිසා මෙම තත්ත්වය ඇති වූ බව දක්වා තිබුණි. | උපරිම කාර්යක්‍ෂමතාවය කින් යුතුව ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු ය. |
| (ආ) | රු. 75,000 ක් වූ පුනරාවර්තන වැය විෂයයක් සහ රු. 3,000,000 ක් වූ ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 05 ක එකතුව රු. 93,585,000ක ප්‍රතිපාදිත මුදලින් රු. 45,401,364ක් එනම් සියයට 48 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | අඛණ්ඩ පැවැත්මක් පවතින බවට උපකල්පනය කරමින් ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තු සකස් කළ ද, 2023/08/31 දිනට දෙපාර්තමේන්තුව ඈවර කිරීමට සහ 2023/12/31 දක්වා පවත්වාගෙන යාමට ගත් තීරණය නිසා ප්‍රාග්ධන වැය විෂයයන් දෙකක ප්‍රතිපාදන උපයෝජනය නොකරන ලද අතර, සංවර්ධන නිලධාරීන් සැලකිය යුතු ප්‍රමාණයක් අවසන් කාර්තුව තුළ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී යාමත්, 2023/01/27 දිනැති 01/2023 අයවැය චක්‍රලේඛ ප්‍රකාරව වියදම් කළමනාකරණය නිසා දේශීය ගමන් වියදම්, අතිකාල හා වැය විෂයයන්හි අතිරික්තයන් ඇති වූ බවත් දක්වා තිබුණි. | වාර්ෂික ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවය කින් උපයෝජනය කළ යුතුය. |

## 2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන ගොස්, ඒ පිළිබඳ කලින් කල සමාලෝචන සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබුව ද එම සමාලෝචන ලිඛිතව සිදුකර නොමැති බව දක්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බඳවාගන්නා ලද පුහුණු ලාභීන්ගෙන් පළමු අදියර යටතේ 31,463 ක් හා දෙවන අදියර යටතේ 3,264 ක් ලෙස අවසන් පුහුණුවලත් මුළු සංඛ්‍යාව 34,727 දෙනෙකු වූ අතර, ඒ සඳහා එකතුව රු.114,008,194 ක මුදලක් ගෙවා තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දින වන විට පත්වීම් ලබාදී ඇති බහුකාර්ය සහයකයින් සංඛ්‍යාව 23,024 පමණක් විය. | අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සැදුම්ලත් රාජ්‍ය සේවයේ බඳවාගැනීම් සමාලෝචන කමිටුව විසින් ආයතනයන්හි ප්‍රාථමික ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා ඒ ඒ ආයතනයන් සතු ප්‍රතිපාදන ප්‍රමාණය, වැටුප් ගෙවීමේ හැකියාව ආදී කාරණා අනුව බඳවාගැනීම් සිදු කරන ලද අතර, ඒ අනුව 2023.12.31 දිනට පත්වීම් ලබා දුන් ප්‍රතිශතය සියයට 80 ක් බවත් දක්වා තිබුණි. | බහුකාර්ය සහයකයින් සඳහා ස්ථිර පත්වීම් ලබාදීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රැකියා ලක්‍ෂයක් ලබාදීමේ වැඩසටහන යටතේ 2020 වර්ෂයේ සිට මේ දක්වා වසර 04 කට ආසන්න කාලයක් ගත වී ඇතත්, පත්වීම් නොලද සම්මුඛ පරීක්‍ෂණ අදියරේ සිටින සහයකයින් සංඛ්‍යාව 3,178 දෙනෙකු හා තවදුරටත් පත්වීම්/ නාමයෝජනා ලබාදිය යුතු සහයකයින් සංඛ්‍යාව 3,207 දෙනෙකු විය. | 2023.12.31 දින වන විටත් රජයේ ආයතනයන් සඳහා බඳවාගැනීමට යොමුකර තිබුණ ද, විවිධ ආයතනයන්හි බඳවාගැනීම් පටිපාටින්හි පවතින පරස්පරතාවයන්, පරීක්‍ෂණ පැවැත්වීමට කල්ගත වීම, සම්මුඛ පරීක්‍ෂණ ප්‍රතිඵල ලබාදීම ප්‍රමාද වීම, ප්‍රාථමික ශ්‍රේණියේ නව තනතුරු සඳහා අවසරය ලැබීම ප්‍රමාද වීම යනාදී හේතුවෙන් සහ ඇතැම් සහයකයින් සම්මුඛ පරීක්‍ෂණ සඳහා සහභාගී නොවීම හේතුවෙන් මෙම ප්‍රමාණය ඉතිරි වූ බව දක්වා තිබුණි. | සම්මුඛ පරීක්‍ෂණ අදියරේ සිටින සහ පත්වීම්/නාමයෝජනා ලබාදිය යුතු සහයකයින් සඳහා අදාළ කාර්ය නිමකර ස්ථිර පත්වීම් ලබාදීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට ස්ථිර පත්වීම් නොලත් හා NVQ සහතික නොලත් බහුකාර්ය සහයකයින් 41 දෙනෙකු විය. | ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ3) අසමත් වීම, නියමිත දිනට විභාගයට සහභාගි නොවීම, විභාගයට ලියාපදිංචි කරන ලද පෞද්ගලික තොරතුරුවල නොගැළපීම් ආදි කරුණු නිසා NVQ3 සහතික නොලැබී තිබුණු බව දක්වා තිබුණි. | NVQ 3 සහතිකය නොලැබී ඇති අයගෙන් එසේ නොලැබීමට හේතු සොයා ඒ සඳහා පිළියම් යෙදිය යුතු ය. |
| (ඈ) | බඳවාගන්නා ලද පුහුණු ලාභීන්ගෙන් 8,841 දෙනෙකු විවිධ හේතූන් මත ඉවත් වීම් සිදු වී ඇති අතර, එම ප්‍රමාණය මුළු බඳවාගත් පුහුණුලාභීන්ගෙන් සියයට 23 ක් විය. | විවිධ විනය කඩකිරීම්, අධිකරණ ක්‍රියාමාර්ගවලින් වැරදිකරු වීම, නොදන්වා සේවයට නොපැමිණීම, විදේශගත වීම, මරණය සිදුවීම ආදී කරුණු හේතුවෙන් 2023.12.31 දින වනවිට පුහුණුලාභීන් 8841 දෙනෙකු දෙපාර්තමේන්තුවෙන් ඉවත්කර ඇති බව දක්වා තිබුණි. | පුහුණුලාභීන් ඉවත්වීමට බලපෑ හේතු සොයා පිළියම් යෙදිය යුතු ය. |

## 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්‍ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්‍ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමෙහි නිලධාරීන් මියයාම සහ සේවය අත්හැර යාම යන හේතූන් මත දැනට දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී නොමැති සේවකයින්ගෙන්, 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වර්ෂයකට වඩා වැඩි එකතුව රු.346,480 ක හිඟ ණය ශේෂයක් පැවතිණි. | මියගිය නිලධාරියාගේ රු. 250,000ක ණය මුදල සඳහා ණය සුරැකුම් රක්‍ෂණාවරණ මඟින් රු. 220,000 ක ණයශේෂය අය කරගැනීමටත්, තනතුර අතහැර ගොස් ඇති, සංවර්ධන නිලධාරිවරයාගේ ණයශේෂය වන රු. 126,480ක මුදල ඇපකරුගෙන් අය කරගැනීමටත් කටයුතු කරන බව දක්වා තිබුණි. | හිඟ ණයශේෂ කඩිනමින් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු ය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 දෙසැම්බර් 31 දිනට තාවකාලිකව ආයතනය වෙත අනුයුක්ත කර, මෙතෙක් ස්ථිර සේවයට බඳවාගෙන නොමැති බහුකාර්ය සංවර්ධන කාර්ය සහයකයින් සංඛ්‍යාව 6,385 දෙනෙකු විය. | 2023.12.31 දින වන විටත් රජයේ ආයතනයන් සඳහා බඳවාගැනීමට නාමයෝජනා යොමුකර තිබුණ ද, එම ආයතනවලින් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කල්ගත වීම, ප්‍රතිඵල ලබාදීම ප්‍රමාද වීම මත ස්ථිර පත්වීම් ලබාදීමට ප්‍රමාද වූ බව දක්වා තිබුණි. | මෙතෙක් ස්ථිර පත්වීම් නොලද බහුකාර්ය සහයකයින්හට කඩිනමින් ස්ථිර පත්වීම් ලබාදීමට කටයුතු කළ යුතු ය. |